# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2424/06 – 2025 පෙබරවාරි මස 17 වැනි සඳුදා – 2025.02.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**වන්දනා ගමන් ආඥාපනත**

**මහා විහාරවංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ 40 වන උපසම්පදා මහෝත්සවය**

මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ 40 වන උපසම්පදා මහෝත්සවය 2025 වූ අප්‍රේල් මස 18, 19 හා 20 යන දිනයන් හි ශ්‍රී රෝහණ සංඝ සභාවේ උපසම්පදා මූලස්ථානය වන මාතර කොටුවේගොඩ පිහිටි රන්දූපත උපෝසථාගාර මහා විහාරස්ථානයේ සීමා මාලකයේ දී පැවැත්වෙන බවත්, එම උත්සවය සඳහා පැමිණෙන වන්දනාකරුවන්ට ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන රැගෙන ඒමෙන් වළකින ලෙස, 1991 ඔක්තෝබර් මස 14 වැනි දින ප්‍රකාශිත එල්. ඩී. බී. 11/60 දරන 175 වන අධිකාරය වන වන්දනා ගමන් ආඥාපනතේ දෙවැනි වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මින් ප්‍රකාශයට පත්කර ඇති නිත්‍ය නියෝග හා රෙගුලාසි උපසම්පදා උත්සවය පැවැත්වෙන කාලසීමාව තුළ වලංගුව පවතින බවත් මෙයින් දැනුම් දෙමි.

**සුසන්ත අත්තනායක,**
ප්‍රාදේශීය ලේකම්,
මාතර කඩවත්සතර.

2025 ක් වූ පෙබරවාරි මස 05 වැනි දින,
මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0141


1A – G 043745 – 09 (2025/02)     ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*